# ස්ත්‍රී පුරුෂභාවය සහ අධ්‍යාපනය

ලංකා වෙඩිකන්දගේ

## හැඳින්වීම

ලෝකයේ බොහෝ රටවල පවුල සහ පාසල වැනි සමාජ සන්දර්භයන් හි, අධ්‍යාපනය සහ සමාජානුයෝජනය සම්බන්ධයෙන් ස්ත්‍රී පුරුෂ භේදය සහ එහි විෂමතාවන් පිළිබඳ දීර්ඝ කාලීන දේශපාලන, සමාජ හා විද්‍යාත්මක විවාදයන් සිදු වෙමින් පවතී. එබැවින් පසුගිය වසර 50 තුළ බොහෝ පර්යේෂණ මගින් ස්ත්‍රී පුරුෂ විවිධත්වය සඳහා සමාජ සංස්කෘතික හා ජීව විද්‍යාත්මක සාධක බලපාන්නේ කෙසේ ද යන්න පිළිබඳ අවධානය යොමු කර ඇත.

බාහිර ස්වරූපයෙන් ගැහැණු හා පිරිමි එකිනෙකට වෙනස්වන අතර අභ්‍යන්තර ස්වරූපයෙන් ගත් විට හෝර්මෝන හා වර්ණ දේහයන්ගේ පැහැදිලි වෙනසක් දැකිය හැකි ය. කෙසේ වෙතත් ස්ත්‍රී පුරුෂ භාවය යන්න ඉතා සරල ව නිර්වචනය කළහොත් පුරුෂයා සහ ස්ත්‍රිය යන්න පෞද්ගලික සංකල්පයක් ලෙස අර්ථ දැක්විය හැකි ය. මෙම සංකල්පය ස්ත්‍රී පුරුෂ භූමිකා පිළිබඳ සංකල්පයට සමීපව සම්බන්ධ වන අතර එය ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව පිළිබිඹු කරන පෞරුෂයේ බාහිර ස්වභාවය ලෙස පෙන්වා දිය හැකි ය. උපතින් පැමිණෙන (සහජ) සහ පාරිසරික සාධකවල එකතුවක ප්‍රතිඵලයක් ලෙස ස්ත්‍රී පුරුෂ අනන්‍යතාව සෑම අවස්ථාවක ම පාහේ ස්වයං හඳුනා ගැනීමකි. එසේ ම ස්ත්‍රී පුරුෂ භූමිකාව සමාජය තුළ ප්‍රකාශ වන්නේ හැසිරීම සහ පෙනුම වැනි නිරීක්ෂණය කළ හැකි සාධක මගිනි. නිදසුනක් ලෙස ගතහොත් පුද්ගලයෙකුට තමා පිරිමියෙකු ලෙස සැලකීමේ දී පුරුෂ ලිංගයෙන් ඔහුගේ පෞද්ගලික ලිංගභේදය ගැන සඳහන් කිරීම වඩාත් පහසුනම් ඔහුගේ ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය පිරිමි ය. නමුත් ඔහුගේ ස්ත්‍රී පුරුෂ සමාජභාවය තුළ පුරුෂ භූමිකාව වන්නේ ඔහු සාමාන්‍ය ජීවිතයේ හැසිරෙන ආකාරය, භාවිත කරන ඇඳුම් පැළඳුම් සහ හැසිරීම්වල පිරිමි ලක්ෂණ පෙන්නුම් කරන්නේ

නම් පමණි. මේ අනුව ස්ත්‍රී පුරුෂ භූමිකාව බොහෝවිට ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවයේ බාහිර ප්‍රකාශනයකි.

ස්ත්‍රී පුරුෂ වශයෙන් පවතින මෙම වෙනස හේතු කොටගෙන විවිධ සමාජවල පුද්ගල චර්යා රටාවන් ගොඩනැගී ඇත. බොහෝ සමාජවල ස්ත්‍රීන්ට වෙන් වූ කාර්යයන් හා පුරුෂයන්ට වෙන්වූ කාර්යයන් දක්නට ලැබේ. දරුවන් හැදීම හා ගෘහ ආශ්‍රිත ක්‍රියාකාරකම් ස්ත්‍රී පාර්ශවයට පැවරී ඇති අතර පවුලේ ආර්ථික කටයුතු ශක්තිමත් කිරීම පුරුෂ කාර්යයන් අතර ප්‍රධාන වේ. ගලගමගේ (2016) පෙන්වා දෙන ආකාරයට පවුලක පැවැත්මට ලිංගික වෙනස මත ශ්‍රම විභජනයක් අනුව ක්‍රියා කිරීම පැවතිය යුතු ලක්ෂණයකි. එබැවින් පවුලක ආර්ථික තත්වය තීරණය කරනු ලබන සාධක අතර ප්‍රධාන වන අධ්‍යාපනය නැමැති සාධකය බොහෝ සමාජවල පුරුෂ පාර්ශවය සඳහා වෙන්වී ඇති ස්වභාවයක් දක්නට ලැබේ. වර්තමානය වන විට ස්ත්‍රී පුරුෂ වශයෙන් වෙන් වූ මෙම ක්‍රියාවන් අභියෝගයට ලක්වෙමින් පවතී. අධ්‍යාපනය ලැබීම හා පවුලේ ආර්ථිකයට කාන්තාවගේ දායකත්වය ලබා දීම කැපී පෙනෙන ලෙස වර්ධනය වී ඇත. එබැවින් ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා අධ්‍යාපනය වර්තමානයේ සාකච්ඡාවට භාජනය විය යුතු ම මාතෘකාවකි.

## පුමිතිරිබව සහ අධ්‍යාපනය

ලෝක ජන ව්‍යාප්තිය තුළ ස්ත්‍රී පුරුෂ නියෝජනය සොයා බැලීමේ දී යුනෙස්කෝ (UNESCO, 2020) සංඛ්‍යා ලේඛන වලට අනුව 2020 වර්ෂයේ ලෝක ජනගහනයෙන් බිලියන 3.8 ක් කාන්තාවන් ද බිලියන 3.9 පුරුෂයන් ද නියෝජනය කරනු ලබයි. මේ අනුව වර්තමාන ලෝකයේ කාන්තා ජනගහනයට වඩා පිරිමි ජනගහනය ඉහළ අගයක් ගන්නා බව පෙනී යයි. පිරිමි දරුවන් ඉපදීම ගැහැණු දරුවන් ඉපදීමට වඩා ඉහළ අගයක් ගන්නා අතර සෑම ගැහැණු උපත් සීයක් සඳහා ම පිරිමි දරුවන් 107 සිට 108 දක්වා ප්‍රමාණයක් උපදිනු ලබයි. නමුත් ආයුෂ භුක්ති විඳීම අතින් ගත්කළ පුරුෂයන්ට වඩා ස්ත්‍රීන්ගේ ආයු අපේක්ෂණය ඉහළ අගයක් ගනු ලබයි.

ඉහත හැඳින්වීමෙහි විස්තර කළ ආකාරයට අතීත පුරුෂ මූලික සමාජයේ අධ්‍යාපනය ලැබීමත් අධ්‍යාපනය ලබා දීමත් පිරිමින්

සතු කාර්යයක් විය. නමුත් සමාජය දියුණුව කරා ගමන් කිරීමත් සමග නව අයිතිවාසිකමක් ලෙස ස්ත්‍රී පුරුෂ භේදයකින් තොරව අධ්‍යාපනය ලබා ගැනීමට සියලු දෙනාට ම අයිතියක් ඇත. අධ්‍යාපනය අත්‍යවශ්‍ය සාධකයක් බවට පත්ව ඇති බැවින් පුරුෂයන්ගේ අධ්‍යාපන මට්ටම මෙන් ම ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටමට ද එකම ආකාරයේ වටිනාකමක් ලැබී ඇත.

නවීන තාක්ෂණයේ දියුණුවත් සමග ස්ත්‍රී භූමිකාවේ බොහෝ සංකීර්ණ ක්‍රියාකාරකම් සරල ක්‍රියාකාරකම් බවට පත්ව ඇත. නමුත් ලෝකයේ විවිධ සමාජ ක්‍රම, සංස්කෘති, පුරුදු සහ විශ්වාස හේතුවෙන් කාන්තා පාර්ශවයට අධ්‍යාපනය ලැබීමටත් ඉන් ලැබෙන ප්‍රයෝජන භුක්ති විඳීමටත් ලැබෙනුයේ මහත් අරගලයකින් පසුව ය. ඉහළ අධ්‍යාපනයක් ලද හොත් සමාජයේ ඉහළ සමාජ ආර්ථික මට්ටමක් ළඟා කර ගත හැකි බව බොහෝ දෙනාගේ විශ්වාසය වේ. සමාජයක ස්ත්‍රීන්ට සාපේක්ෂ ව පුරුෂයින්ට අධ්‍යාපනය ලැබීමට ඇති අවස්ථා ඉහළ අගයක් ගන්නා අතර එම නිසාම කාන්තාවන් අධ්‍යාපන පද්ධතියේ බොහෝ අසාධාරණකම්වලට ලක් වී ඇත.

මේ හා සමාන අදහසක් ඉදිරිපත් කරන (ගලගමගේ, 2016) ස්ත්‍රී පුරුෂ වශයෙන් පවතින සමාජ ස්ථරවල වෙනස අනුව පුද්ගල චර්යා ගොඩනැගී ඇති බවත් ස්ත්‍රී සමාජය පුරුෂයා විසින් මෙහෙයව වීම නිසා පුරුෂාධිපත්‍යයේ විවිධ ගැටලු පැන නැගී ඇති බව පෙන්වා දෙයි. එසේ ම දරුවන් හදා වඩා ගැනීමේ පිළිවෙත්, ඔවුන්ට දෙන ක්‍රීඩා භාණ්ඩ, ඇඳුවම් හා මග පෙන්වන ආකාරය ආදිය තුළින් කුඩා කළ සිට ම ස්ත්‍රී පුරුෂ පෞරුෂ සංවර්ධනය කිරීමේ සුවිශේෂී රටා පවතී. එම නිසා ම අධ්‍යාපන ක්‍රීයාවලියට ද පුමිතිරි බව ආශ්‍රිත ගැටලු සම්බන්ධ විය හැකි බව තවදුරටත් පෙන්වා දෙයි.

එසේ ම සමාජයෙන් සමාජයට පුමිතිරි බව ආශ්‍රිත ගැටලු විවිධාකාර වේ. එනිසා එම තත්වය අධ්‍යාපනයේ ද විද්‍යමාන වන බවක් දක්නට ලැබේ. නිදසුනක් ලෙස ගතහොත් බොහෝ බටහිර රටවල් ස්ත්‍රීන්ගේ අධ්‍යාපනය දෙස ඉතා ධනාත්මක අදහස් දරන අතර බොහෝ අප්‍රිකානු ආසියානු රටවල මෙම තත්ත්වය සාපේක්ෂ ව ඍණාත්මක වේ. ස්ත්‍රී පුරුෂ භූමිකාවන් හි විෂමතා සෑම සමාජයක

ම වාගේ පැවතිය ද එය සමාජ ගැටලුවක් ලෙස බලපා ඇති ආකාරය සමාජයෙන් සමාජයට වෙනස් ය (ගලගමගේ, 2016). එබැවින් මින් ඉදිරියට මෙම ලිපියෙහි පුමිතිරි බව හේතු කොටගෙන පැන නැගී ඇති අධ්‍යාපන ගැටලු එකින් එක විමසා බැලීම සිදු වේ.

## 1. අධ්‍යාපනයට ප්‍රවේශ වීම

ස්ත්‍රී පුරුෂ බව අනුව අධ්‍යාපනයට ප්‍රවේශ වීමේ අසමානතා දක්නට ලැබේ. මෙහි මූලාරම්භය ඓතිහාසික යුග දක්වා දිව යනු දක්නට ලැබේ. ප්‍රාග් ඓතිහාසික යුගයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ගත් කල ප්‍රාථමික සංස්කෘති නොනැවතී පැවතීම සඳහා අධ්‍යාපනය භාවිත වූ බව පෙනී යයි. එහි දී අධ්‍යාපනය යොදාගනු ලැබූයේ සංස්කෘති සම්ප්‍රේෂණ ක්‍රියාවලිය සඳහා පමණි. අධ්‍යාපනයේ පරමාර්ථය වූයේ දරුවන්ට ඔවුන්ගේ ගෝත්‍රයේ හෝ කණ්ඩායමේ හොඳ සාමාජිකයෙකු වීමට පෙළඹවීමයි. මෙහි දී ඔවුන්ගේ ගුරුවරුන් ආගන්තුකයන් නොවූ අතර ඔවුන් ශිෂ්‍යයන්ගේ ආසන්නත ම ප්‍රජාව විය. විධිමත් ගුරු වෘත්තියේ නියුතු වූ පිරිස සම්පූර්ණයෙන් ම පිරිමින්ගෙන් සමන්විත විය. කාන්තාවන් විධිමත් අධ්‍යාපනයට පිවිසීම ඉතා සීමා වූ අතර ඉගෙනීමත් ඉගැන්වීමත් පිරිමින් සතු විය (Tranenka et al, 2019).

වර්තමානයේ ලෝකයේ බොහෝ රටවල කාන්තාවන් අධ්‍යාපනය සඳහා යොමුවන ප්‍රවණතාවක් දක්නට ලැබේ. නමුත් මෙම ප්‍රවණතාවයේ කලාපීය වෙනස්කම් ද දක්නට ලැබේ. පවතින ගෝලීය සංඛ්‍යා ලේඛනවලට අනුව (UIS/ GEM, Report Policy Paper 27/ Fact Sheet 37 2016 : P.1) ළමුන් හා තරුණයන් මිලියන 263ක් පාසලෙන් බැහැර ව සිටිති. ප්‍රාථමික මට්ටමේ ළමුන් මිලියන 61ක් පාසලෙන් බැහැර ව සිටින අතර ගෝලීය වශයෙන් පාසල් නොයන ප්‍රතිශතය 9% කි. ඔවුන්ගෙන් මිලියන 321ක් ගැහැනු ළමයින් වේ. ප්‍රතිශතාත්මක ව එය 53% කි. මෙම සංඛ්‍යා ලේඛන කලාපීය හා රටවල් මට්ටමෙන් විවිධ වේ. ඒ අනුව බටහිර ආසියාවේ නව යොවුන් වියේ ගැහැනු ළමයින්ගෙන් 20%ක් පහළ ද්විතියික අධ්‍යාපනයෙන් බැහැරව සිටින්නේ පිරිමි ළමයින්ගේ 13% කට සාපේක්ෂව ය. උපසහරා අප්‍රිකාවේ පාසල් නොයන කාන්තාවන්ගේ අනුපාතය 36% ක් වන අතර එය පිරිමින් සඳහා 32%කි. උතුරු අප්‍රිකාව දකුණු ආසියාව උප

සහරා අප්‍රිකාව හා බටහිර ආසියාවේ ද අධ්‍යාපනයෙන් බැහැරව සිටින වැඩි පිරිසක් කාන්තාවන් වේ. යුරෝපයේ පවා අධ්‍යාපන ව්‍යාප්තියට පෙර ගැහැනු ළමයින් පිරිමි ළමයින්ට වඩා අඩු අධ්‍යාපන මට්ටමක් ලබා ගත්හ. නමුත් 1960 දශකයෙන් පසු ගැහැනු ළමයින් අධ්‍යාපන ව්‍යාප්තියේ බොහෝ ප්‍රයෝජන ලබා ගත්හ.

අධ්‍යාපනික ජයග්‍රහණයේ විෂමතාවයට මානයන් දෙකක් ඇත. ඒවා නම් සහභාගිත්ව විෂමතා සහ කාර්ය සාධන විෂමතා වේ (Jha and Kelleher, 2006). ඓතිහාසිකව, විශේෂයෙන් අඩු අධ්‍යාපනික සහභාගිත්වයක් ඇති රටවල ගැහැණු ළමයින් අධ්‍යාපනය ලබා ගැනීමේ දී සැලකිය යුතු අවාසි වලට මුහුණ දී තිබේ. කෙසේ වෙතත් ප්‍රාථමික මට්ටමේ අධ්‍යාපනය දෙස බැලුවහොත් මෙම පරතරය අඩු වෙමින් පවතී. සාම්ප්‍රදායික ස්ත්‍රී පුරුෂ අධ්‍යාපනික පරතරය වසා දැමීම සඳහා විශ්වීය ප්‍රාථමික අධ්‍යාපනය මගින් ගෝලීය දියුණුවක් අත්පත් කර දී ඇත. කෙසේ වෙතත් බොහෝ රටවල ගැහැණු ළමයින් පාසල් අධ්‍යාපනය සඳහා පිවිසීමෙන් පසු බොහෝ විට පිරිමි ළමයින් අභිබවා අධ්‍යාපන දියුණුව සහ අධ්‍යාපන කාර්ය සාධනය යන දෙකෙන් වැඩි වාසි ලබා ගනු දක්නට ලැබේ. මේ අනුව පෙනී යන්නේ අධ්‍යාපනයේ ඓතිහාසික ස්ත්‍රී පුරුෂ භාවයේ පරතරය අඩු වුවත් අධ්‍යාපන සහභාගිත්වය පිරිමින්ගේ අඩු සහභාගිත්වය වැනි නව ප්‍රවනතා මතු වෙමින් පවතින බවකි.

ද්විතීක මට්ටමින් අධ්‍යාපනය සඳහා සහභාගි වීමේ දී ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය පිළිබඳ ගෝලීය චිත්‍රය මිශ්‍ර ය. මධ්‍යම හා ඉහළ මැදි ආදායම් ලබන රටවල පිරිමි ළමයින්ගේ ද්විතීක අධ්‍යාපන සහභාගිත්වය ගැන විශේෂයෙන් සැලකිලිමත් වේ (UNESCO, 2018). පසුගිය දශක කිහිපය පහළ ආදායම් මට්ටමේ සිට මධ්‍යම ආදායම් මට්ටම් දක්වා ආදායම ඉහළ ගිය රටවල් ද ඉහළ මධ්‍යම ආදායම් ලබන රටවල ද්විතීයික අධ්‍යාපනය සඳහා පිරිමි ළමයින්ගේ සහභාගිත්වයේ අභියෝගයකට මුහුණ දී සිටිති. බ්‍රසීලය, මැලේසියාව හා තායිලන්තය වැනි රටවල් ද ද්විතීක අංශයේ පිරිමි ළමයින්ගේ අඩු සහභාගිත්වය සහ පාසල හැර යෑම වැනි ගැටළුවලට මුහුණ දී සිටිති. ඉහළ ආදායම් ලබන බටහිර යුරෝපා රටවල ද ද්විතීක අංශයට ඇතුළත් වීමේ පිරිමි ළමයින්ට අහිතකර වූ ස්ත්‍රී පුරුෂ භාවයේ පරතරය වැඩි වෙමින්

පවතින බවක් දක්නට ලැබේ (2000 - 1.02 සිට 2014 - 1.01 දක්වා අඩු වී ඇත) (UNESCO 2015: UIS 2016).

ඉහළ ආදායම් ලබන රටවල වයස 5 ත් 16 ත් අතර අධ්‍යාපනය අනිවාර්ය වේ. එබැවින් අධ්‍යාපනික සහභාගිත්වය වෛකල්පිත වූ විට මෙම රටවල සහභාගීත්වයෙන් ස්ත්‍රී පුරුෂ භාවය පිළිබඳ ව පරිසරය වඩාත් පැහැදිලිව අනාවරණය කර ගත හැකි වේ. උදාහරණයක් වශයෙන් මෙම රටවල 2014 වර්ෂයේ ඉහළ ද්විතීකය සම්පූර්ණ කළ අනුපාත සම්බන්ධයෙන් පිරිමින් සඳහා 83%ක් පමණ වූ විට ඒ කාන්තාවන්ට එය 88%ක් විය. එසේ ම මෙම රටවල පිරිමි ළමයින්ට සාපේක්ෂව ගැහැණු ළමයින් 15% ක් විශ්වවිද්‍යාල අධ්‍යාපනය සම්පූර්ණ කරන බව ද අනාවරණය කර ගෙන ඇත (UNESCO, 2012).

**2. අධ්‍යාපන සාධනය**

(හැඩ්ජර් ඇතුළු පිරිස, 2014) පෙන්වා දෙන ආකාරයට ප්‍රාථමික පාසලේ නිපුණතාවන් හි දී ස්ත්‍රී පුරුෂ භේදයේ වෙනසක් දැකිය හැකි ය. ගැහැනු ළමයින් භාෂා අධ්‍යනයේ දී වැඩි ලකුණු ලබා ගන්නා අතර පිරිමි ළමයින් ගණිතය හා විද්‍යා විෂයයන් හි දී ගැහැනු ළමයින් අභිබවා යති. විශේෂයෙන් භාෂා විෂයන් හැදෑරීමේ දී (ජර්මන්, ප්‍රංශ, ඉංග්‍රීසි) පිරිමි ළමයින්ට වඩා ගැහැණු ළමයින්ගේ පාසල් ශ්‍රේණි ලකුණු මට්ටම සැලකිය යුතු ලෙස ඉහළ මට්ටමක පවතින බව පෙන්වා දෙයි. එසේම සංගීත විෂය ගත්කල අධ්‍යාපන සාර්ථකත්වයේ සැලකිය යුතු ස්ත්‍රී පුරුෂ භේද නොමැත.

Klaproth et al, (2013) පෙන්වා දෙන්නේ පිරිමි ළමයින් මෙන්ම ගැහැනු ළමයින් ද අධ්‍යාපන කටයුතුවල දී තීරණ ගැනීමේ දී ස්ත්‍රී පුරුෂ භේදයක් නොමැති බවයි. එසේ වුව ද පාසල් ලකුණුවල පැහැදිලි ස්ත්‍රී පුරුෂ පරතරයක් ඇත. ගැහැනු ළමයින් පාසලේ දී සාමාන්‍යයෙන් පිරිමි ළමයින් අභිබවා යති. නිදසුනක් ලෙස ඔවුන් පෙන්වා දෙන්නේ අන්තර් ජාතික ශිෂ්‍ය ඇගයීම් සටහනේ (PIAS : OCED, 2013) නිපුණතා පරීක්ෂණ ලකුණු සටහන්වලට අනුව භාෂාවන් ඉගෙන ගැනීමේ දී හා ගණිත විෂය සාධනයේ දී ගැහැනු ළමයින්ගේ දක්ෂතාවයන් පිරිමි ළමයින්ට වඩා ඉහළ අගයක් ගෙන ඇත බවකි. බොහෝ රටවල පිරිමින්ට වඩා කාන්තාවන් උසස් අධ්‍යාපන

ආයතනවල අධ්‍යාපනය ලැබීමට පටන් ගෙන ඇත. කෙසේ වෙතත් උසස් අධ්‍යාපන ආයතනවලට මාරුවෙන අනුපාතය එනම් උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීමට සුදුසුකම් ලබන පුද්ගලයන්ගේ ප්‍රතිශතය පුරුෂ පක්ෂය තුළ තවමත් ඉහළ මට්ටමක පවතී.

**3. අධ්‍යාපනය හේතු කොට ගෙන ආර්ථික වාසි ලැබීම**

අධ්‍යාපනයේ පවත්නා විවිධ ආකාරයේ ස්ත්‍රී පුරුෂ අසමානතාවය සඳහා න්‍යායාත්මක හා ආනුභාවික පැහැදිලි කිරීම් කිහිපයක් තිබේ. කාන්තාවන්ගේ අධ්‍යාපනය සම්බන්ධ අඩු ක්‍රියාකාරීත්වය සහ අඩු නියෝජනය, අධ්‍යාපනය සඳහා ඇති ආයෝජනය මත කේන්ද්‍රගත වේ. කාන්තාවන් අධ්‍යාපනය සඳහා ආයෝජනය කරනු ලබන්නේ ශ්‍රම වෙළෙඳපොළේ කාන්තාවන්ට ඔවුන් ලබන අධ්‍යාපනය ආදායම හා සමාජ තත්ත්වය බවට පරිවර්තනය කිරීමට හැකි වූ විට පමණි. මෙම දෘෂ්ටි කෝණයෙන් බලන කල කාන්තාවන්ගේ සම්ප්‍රදායික අධ්‍යාපනික රටාව පිටුපස ඇති ප්‍රධාන සාධක වන්නේ ඔවුන් ගෘහස්ථ හා දරුවන් ඇති දැඩි කිරීමේ ක්‍රියාකාරකම් කෙරෙහි දක්වන ඉහළ සම්බන්ධතාව මෙන් ම ශ්‍රම වෙළෙඳපොළේ ඔවුන්ට ඇති අඩු අවස්ථාවන් ය.

කාන්තාවන්ගේ වැඩිවන අධ්‍යාපන සහභාගිත්වයට හේතුව ලෙස වෙනස් වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය හා කාන්තා ශ්‍රමයට ශ්‍රම වෙළෙඳපොළ තුළ ඇති ඉහළ ඉල්ලුම පෙන්වා දිය හැකි ය. ජීවන සැලසුම් නවීකරණය කිරීම හේතුවෙන් පසුගිය දශක කිහිපය තුළ කාන්තා ජීවන අපේක්ෂාවන් සහ ජීවන සැලසුම් බොහෝ වෙනස් වී ඇත. විශේෂයෙන් විවාහයේ සමාජ හා ආර්ථික වැදගත්කම අඩු වීම සහ කාන්තාවන් අතර ජීවනෝපායන් උපයා ගැනීම සඳහා කාන්තා ශ්‍රම සහභාගිත්වයේ වැදගත්කම අවබෝධ වීම කාන්තාවන්ට අධ්‍යාපනය වඩාත් ආකර්ෂණීය කරවන අවස්ථාවන් විය (Breen et al, 2010).

**4. වෘත්තීය තේරීම**

කාන්තාවන්ගේ අධ්‍යාපනයේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක වර්ධනයක් දක්නට ලැබුණත් වෘත්තීය තේරීම සහ අධ්‍යාපන අංශය

තේරීම සම්බන්ධයෙන් අතීතයේ සිට පැවත එන අඛණ්ඩ රටාවක් තවමත් පවතී. ස්ත්‍රී පුරුෂ සමාජ භාවය තුළ කාන්තාවන් තවමත් හෙදියන්, ගුරුවරුන් හෝ වෙනත් සේවා වෘත්තීන්වල නිරතවීම සහ පිරිමින් ඉහළ අධිකාරියේ වෘත්තීන් තෝරා ගැනීමට වැඩි කැමැත්තක් දැක්වීම යන කාරණා සම්බන්ධයෙන් ශ්‍රම බලකාය වෙන් කිරීම තව දුරටත් දක්නට ලැබේ.

උසස් අධ්‍යාපනය සඳහා ගැහැනු ළමයින් වැඩි වශයෙන් සහභාගි වුව ද විද්‍යා, තාක්ෂණ, ඉංජිනේරු සහ ගණිතය යන ක්ෂේත්‍රයන් හි ඔවුන්ගේ නියෝජනය අඩු මට්ටමක පවතී. නමුත් අධ්‍යානය, සෞඛ්‍ය සහ සුභසාධනය යන අංශවලින් කාන්තා නියෝජනය ඉහළ අගයක් ගෙන ඇත.

### ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය

ශ්‍රී ලංකාව ආර්ථික හා මානව සංවර්ධනයේ ජයග්‍රහණ සහිත පහළ මධ්‍යම ආදායම් ලබන රටකි. වසර 30කට ආසන්න ගැටුම මධ්‍යයේ වුව ද කලාපීය රටවල් අතර ඉහළ මානව සංවර්ධන දර්ශකයක් සහිත රටකි. 2019 වර්ෂයේ මානව සංවර්ධන දර්ශකය 0.782 වැනි ඉහළ අගයක් ගන්නා ලදී (UNDP, 2020). එසේ ම අධ්‍යාපනය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය වර්ධනය කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ප්‍රමුඛ ස්ථානයක සිටිනු දක්නට ලැබේ. කෙසේ වෙතත් UNDP (2016) කරන ලද ස්ත්‍රී පුරුෂ සමාජ අසමානතාවය දර්ශකය රටවල් 159 න් 89 වැනි ස්ථානයට ශ්‍රී ලංකාව පත් ව ඇත. එම ස්ථානය ශ්‍රී ලංකාවට ලැබීමට ප්‍රධාන හේතු නම් කාන්තාවන් අතර පවතින ඉහළ රැකියා වියුක්තිය හා ඉතා පහළ මට්ටමක පවතින කාන්තාවන්ගේ දේශපාලන නියෝජනය වේ. කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ 2018 පුරුෂ සාක්ෂරතාව 92.7 වන අතර එය ස්ත්‍රීන්ට 90.0ක් වේ.

ශ්‍රී ලංකාවේ කාන්තාවන් අධ්‍යාපනයෙන් ඉහළ ප්‍රතිඵල ලැබූවත් කාන්තාවන්ගේ අධ්‍යාපන ජයග්‍රහණ රැකියා අවස්ථාවන් හි සමානාත්මතාවය ලබා ගැනීමට ඔවුන්ට උදව් නොකරයි. ඒ පිළිබඳ නිදසුන් වගු අංක 1හි ඉදිරිපත් කර ඇත.

**වගු අංක 1: ශ්‍රී ලංකාවේ රැකියා වියුක්ති ප්‍රතිශතය (2020)**

| වයස් කාණ්ඩ | මුළු සංඛ්‍යාව | මුළු ප්‍රතිශතය | පිරිමි% | ගැහැනු% |
|---|---|---|---|---|
| ශ්‍රී ලංකාව | 486,524 | 5.8 | 4.3 | 8.6 |
| 15 - 24 | 242,570 | 25.9 | 21.0 | 35.8 |
| 25 - 29 | 106,652 | 13.0 | 9.7 | 18.4 |
| 30ට වැඩි | 137,302 | 2.0 | 1.3 | 3.5 |

Sri Lanka Labor Force Statistics (2020)

වගු අංක එකෙහි ඉදිරිපත් කර ඇති ශ්‍රී ලංකාවේ 2020 වසරේ පළමු කාර්තුව සඳහා ශ්‍රම බලකායේ දත්තවලට අනුව අවුරුදු 15-24 ත් අතර වයස් කාණ්ඩයේ විරැකියාවෙන් පෙළෙන මුළු ප්‍රතිශතය 25.9%කි. ඉන් 35.8% ක් ස්ත්‍රීන් වන අතර 21.0%ක් පිරිමින් වේ. එසේ ම 25-29 වයස් කාණ්ඩයේ විරැකියාව 13.0% ක් වන අතර ඉන් 18.4%ක් කාන්තාවන් වන්නේ පිරිමි ප්‍රතිශතය 9.7% වන විට ය.

ශ්‍රී ලංකාවේ විරැකියාවෙන් පෙළන පිරිස ගැහැනු පිරිමි ලෙස වෙන් කළ හොත් ස්ත්‍රී සංඛ්‍යාව පිරිමි සංඛ්‍යාවට වඩා ඉහළ මට්මක් ගන්නා බව වගු අංක 2 අනුව පැහැදිලි වේ.

**වගු අංක 2: අධ්‍යාපන මට්ටම අනව රැකියා විරහිත සංඛ්‍යාව**

| අධ්‍යාපන මට්ටම | ශ්‍රී ලංකාව | විරැකියා ප්‍රතිශතය | | |
|---|---|---|---|---|
| | | ශ්‍රී ලංකාව | ස්ත්‍රී පුරුෂ භාවය | |
| | | සංඛ්‍යාව | පුරුෂ | ස්ත්‍රී |
| ශ්‍රී ලංකාව | 486,524 | 5.8 | 4.3 | 8.6 |
| Below GCE O/L | 182,426 | 3.7 | 3.3 | 4.8 |
| GCE O/L | 109,601 | 7.3 | 5.6 | 11.3 |
| GCE A/L & above | 194,496 | 9.6 | 6.7 | 12.7 |

Sri Lanka Labor Force Statistics (2020)

අධ්‍යාපනය තුළ සෑම මට්ටමක ම විරැකියා ප්‍රතිශතය පිරිමින්ට වඩා ස්ත්‍රීන්ගේ ඉහළ ම මට්ටමක් දක්නට ලැබේ. අ.පො.ස. උසස් පෙළ හෝ ඊට ඉහළ අධ්‍යාපනයක් ලබා ගත් පිරිස අතර විරැකියාව ඉහළ ය. ඒ අතරිනුත් ස්ත්‍රීන්ගේ ප්‍රතිශතය (12.7%) පිරිමින්ට (6.7%) සාපේක්ෂ ව හරි අඩකටත් වඩා වැඩි අගයක් ගනී. ශ්‍රී ලංකාව සමස්තයක් ලෙස ගෙන බැලූ විට ද සමස්ත විරැකියා ප්‍රතිශතයෙන් (5.8%) පුරුෂයන්ට (4.3%) වඩා දෙගුණයක් ස්ත්‍රීන් (8.6%) විරැකියාවෙන් පෙළේ.

එසේ ම 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පළමු කාර්තුවේ ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ජනගහනය මිලියන 8.5කි. ඉන් 65.7%ක් පිරිමින් වන අතර 34.3%ක් කාන්තාවන් වේ. එම තොරතුරු වගු අංක තුනෙහි දක්වා තිබේ.

**වගු අංක 3 : ස්ත්‍රී පුරුෂ භාවය අනුව ආර්ථික වශයෙන් සක්‍රීය ජනගහන**

| අංශය | ආර්ථික සක්‍රීය ජනගහනය | | | | | |
|---|---|---|---|---|---|---|
| | මුළු සංඛ්‍යාව | % | පිරිමි | % | ගැහැනු | % |
| ශ්‍රී ලංකාව | 85,03,617 | 100 | 5,585,314 | 65.7 | 2,918,304 | 34.3 |
| නාගරික | 1,358,282 | 100 | 925,697 | 68.2 | 432,585 | 31.8 |
| ගම්බද | 6,755,767 | 100 | 4,426,599 | 65.5 | 2,329,168 | 34.5 |
| වතු | 389,569 | 100 | 233,038 | 59.8 | 156,551 | 40.2 |

Sri Lanka Labor Force Statistics (2020)

එසේ ම ආර්ථික වශයෙන් අක්‍රිය ජනගහනය මිලියන 8.2කි. එයින් 26.1%ක් පිරිමින් වන අතර 73.9% ක් කාන්තාවන් වේ.

Report of Dimensions of Education Access and Achievement (2018) පෙන්වා දෙන ආකාරයට ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ කාන්තා සහභාගිත්වය දුර්වල මට්ටමක පවතී. එය තව දුරටත් විස්තර කරන ගුණවර්ධන (2010) පෙන්වා දෙන්නේ පිරිමින් හා සසඳන විට කාන්තාවන්ට අඩු වැටුප් ගෙවන බවයි. අනෙක් අතට රට තුළ කාන්තා ශ්‍රම බලකායේ සහ සහභාගි වීමේ අඩු අනුපාතයට දායක වන වෙනත් සංකීර්ණ සංස්කෘති විචල්‍යයන් සමූහයක් තිබිය හැකි ය (ගුණතිලක, 2018).

නමුත් සේවා නියුක්ති අංශ අනුව ගත්කල ශ්‍රී ලංකාවේ ගැහැනු හා පිරිමි නියෝජනයේ කැපී පෙනෙන වෙනස්කම් දක්නට නොලැබේ.

ප්‍රධාන කර්මාන්ත අංශ අනුව ගත් විට විශාල ප්‍රමාණයක් සේවා අංශයේ රැකියාවල නියුක්ත වේ. එය 46.4% කි. ඒ තුළ පිරිමින් 46.4%ක් ද ගැහැනුන් 46.2%ක් ද නියෝජනය කරනු ලබන කෘෂි කර්මාන්තයේ නියුතු පිරිස 26.5%ක් වන අතර ඒ තුළ ගැහැනු 27.7%ක් පිරිමි 25.9% ක් ද නියෝජනය වේ. කර්මාන්ත අංශය 27.1%ක නියෝජනයක් ඇති අතර ගැහැනු 26.0%ක් ද පිරිමි 27.6%ක් ද නියෝජනය කරනු ලබයි (Sri Lanka Labor Force Statistics, 2020).

ස්ත්‍රී පුරුෂ බව අනුව විෂය තෝරා ගැනීමේ දී ගැටලු සිදුවන බව ගලගමගේ (2016) පෙන්වාදී තිබේ. ශ්‍රී ලංකාවේ පිරිමි ළමයින් තාක්ෂණික විෂයන් වැඩි වශයෙන් තෝරා ගැනීමේ නැඹුරුවක් පවතින බව ඔහු පෙන්වා දී තිබේ. මෙය රැකියා වෙළෙඳපොළේ පවතින අවස්ථා හා පරස්පර වේ. සංචාරක ව්‍යාපාරය ආශ්‍රිත සූපවේදීන් සඳහා ඉල්ලුමක් ඇතත් එයට අදාළ විෂය ඉගෙනුම ලැබූ පිරිමි ළමයි විරල වෙති. තාක්ෂණික අංශය විශේෂයෙන් ම ගැහැනු ළමයින් තුළ අඩු වශයෙන් පවතින විට ඔවුන්ට වෘත්තිය අවස්ථාවන් ද සීමා සීමා සහිත වේ. මේ තත්ත්වය අනුව විශ්වවිද්‍යාල උපාධි ලැබූ අයටත් අසාධාරණකම් සිදුවන බව ඔහු තවදුරටත් පෙන්වා දී තිබේ.

**සාරාංශය**

මෙම ලිපිය මගින් ස්ත්‍රී පුරුෂ භාවය සහ අධ්‍යාපනය පිළිබඳ සාකච්ඡා කර ඇත. එහි දී ඓතිහාසික වශයෙන් පුරුෂ පක්ෂයට වඩාත් වාසිදායක ලෙස හසුරුවනු ලැබූ අධ්‍යාපනය වර්තමානය වන විට ගැහැණු ළමයින් වඩාත් ආකර්ෂණීය කර ඇති බව පෙන්වා දී තිබේ. එසේම ස්ත්‍රී භූමිකාව තුළ අධ්‍යාපනය හැදෑරීමට ඇති අපහසුතා සහ ඔවුන් අධ්‍යාපනයෙන් අත්පත් කරගෙන ඇති සමාජ ආර්ථික තත්ත්වය ද විග්‍රහ කර ඇත. උසස් අධ්‍යාපනය තුළ පිරිමි ළමයින්ගේ සහභාගිත්වය පහළ යාමත් තවමත් බොහෝ රැකියා පිරිමි පාර්ශ්වයට විවෘත වී තිබීමත් ගැටලු සහගත වේ. එසේම මෙම ලිපියෙන් ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය තුළ ස්ත්‍රී පුරුෂ සමාජ භූමිකාවට හිමිවී ඇති ස්ථානය ද සාකච්ඡාවට බඳුන් කර ඇත. එමගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ විෂමතාවන් ඉතා අඩු බවත් නමුත් ශ්‍රම වෙළෙඳපොළ තවමත් පිරිමි පාර්ශ්වයට වඩාත් විවෘත වී ඇති බවත් පෙන්වා දී ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

ගලගමගේ, එස්. (2016) *අධ්‍යාපන සමාජ විද්‍යාව මූලධර්ම,* කර්තෘ ප්‍රකාශන, පන්නිපිටිය, ශ්‍රී ලංකාව.

Breen, R., R. Luijkx, W. Muller, and R. Pollak. 2010. "*Long-term Trends in Educational Inequality in Europe*: Class Inequalities and Gender Differences." European Sociological Review 26: 31–48. doi:10.1093/esr/jcp001

Gunatilaka, R (2013).*Women's Participation in the Sri Lankan Labor Force:Trends, Drivers and Constrains*. The International Labor Organization. Colombo. http://www.iol.org/wcmsp5/groups/public/---asia/---ro-bangkok/---ilo colombo/documents/publication/wems_215445.pdf

Hadjar, A.,Schwerdt, S. K., Priem K., & Glock, S.,(2014) *Gender and educational achievement*, Pages 117-125/Published online:29 Apr 2014 Volume 56, 2014 – Issue 2

Jha,J. & Kelleher, F. (2006) *Boys' Underachievement in Education: An Exploration in selected Commonwealth countries*. http://hdl.handle.net/11599/168

Klapproth, F., S. Krolak-Schwerdt, S. Glock, R. Martin, and M. Böhmer. 2013. "*Prädiktoren Der Sekundarschulempfehlung in Luxemburg: Ergebnisse Einer Large-Scale-Untersuchung [Predictors of the Luxembourgish Secondary School Recommendations: Findings from a Large Scale Study]*." Zeitschrift Für Erziehungswissenschaft 16: 335–379.doi:10.1007/s11218-012-9197-

OECD. 2013. PISA 2012 Results: *What Students Know and can do – Student Performance in Mathematics*, Reading and Science. Paris: OECD Publishing. http://dx.doi.org/10.1787/9789264201118-en.

South Asia Region, *Education Global Practice, Gender Dimensions of Education Access and Achievement in Sri Lanka*. (2018)The world Bank.

*Sri Lanka Labor Force Statistics Quartly Bulletin, 2020, Sri Lanka Labor Force Survey 1st Quarrtly* ISSN 1391-3050 ISSUE No. 88, Department of Census and Statistics, Ministry of Finance, Economy and Policy Development

Tranenka, N., Rusetskiy, M., Yanova, E., Okorokova, O. &Aygumov, T. (2014). *Education as Socio-cultural and Economic Potential of the*

*Global Information Society*. Journal of History Culture and Art Research, 8 (1), 136-145

UIS/ GEM, Report Policy Paper 27/ Fact Sheet 37 2016: P.1) *EFA Global Education Monitoring Report* c/o UNESCO

UNDP (2016).”*Human Development Report*: Briefing note for countries on the 2016 Human Development Report.” http://hdr.undp.org/sites/all/themes/hdr_them/country-notes/LKA.pdf

UNESCO (2012). *World Atlas of Gender Equality in Education*. UNESCO. Paris.

UNESCO (2015). “*Education for All (2010-2015): Achievements and Challenges*”, UNESCO Global Monitoring Report. UNESCO Publishing Paris, France.

UNESCO (2018). “*Achieving Gender Equity in Education: Don’t Forget the Boys*”. Policy Paper 35.Global Education Monitoring Report. UNESCO

UNESCO, *Human Development Report*, (2020) The Next Frontier: Human Development and the Anthropogenic Briefing note for countries on the 2020 Human Development Report

**Web sites**

http://hdr.undp.org/sites/default/files/Country-Profiles/LKA.pdf

world-women-2020-data-undesa-hub.arcgis.comcom/pages/economic-empowerment

https://www.globalpartnership.org/what-we-do/gender-equality-12.08.201.